**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 32/2026**

මගේ අංකය:- PPSC/ES/12/FI/04/03/08
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
පළාත් සභා සංකීර්ණය
නව නගරය, රත්නපුර
2026.08. 07

01. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, සබරගමුව පළාත
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත
03. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර / කෑගල්ල

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විශේෂ ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවීම.**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CS06/01/15/06 හා 2026.02.09, 2026.06.09 දිනැති ලිපි මඟින් හා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක CM/AD/13/02/08 හා 2026.01.31, 2026.06.02 දිනැති ලිපි මඟින් නිර්දේශ කර ඇත. ඒ අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අංක PD/ADF/02/06/26 හා 2026.04.28 දිනැති ලිපිය මඟින් දක්වා ඇති පරිදි **2025.10.24 දින** ඇති වී තිබෙන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි විශේෂ ශ්‍රේණියේ **පුරප්පාඩුව (01)** සඳහා පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ විශේෂ ශ්‍රේණියට හිමි වැටුප් ඛණ්ඩය වන MT 08-2025 ට අදාළ වැටුප් පරිමාණය රු. 86,800-10 x 2,420-8 x 2,940 - 134,520 /- වේ. උසස් කිරීම සඳහා සුදුසුකම් සපුරාලිය යුතු දිනය ලෙස **2025.10.24** දිනය සැලකිල්ලට ගනු ලැබේ

02. මෙම චක්‍රලේඛයේ හා අයදුම්පත්‍රයේ පිටපතක් සබරගමුව පළාත් සභා නිල වෙබ් අඩවියේ (www.sg.gov.lk) හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.psc.sg.gov.lk) පළ කර ඇත. මෙම චක්‍රලේඛය පහත සුදුසුකම් සපුරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.

03. අයදුම්කරුවන් විසින් තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියට අනුව පහත සඳහන් සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතුය.

I. **පළපුරුද්ද** - මහජන සෞඛ්‍ය පරීක්ෂක/ආහාර හා ඖෂධ පරීක්ෂක තනතුරෙහි I වැනි ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ වසර පහ (05) සේවා කාලයක් සහිත අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. **කායික සුදුසුකම්** - සෑම අපේක්ෂකයෙකුම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. **වෙනත් සුදුසුකම්**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
- උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
- අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.
- පළමු වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබිය යුතුය.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

**04. ලකුණු ලබාදීමේ ක්‍රමය :-** සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා වූ විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුව ලකුණු ලබාදෙන නිර්ණායක පහත පරිදි වේ.

| අනු අංකය | | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | I ශ්‍රේණියේ සේවා කාලය<br>(I ශ්‍රේණියට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 03 බැගින් උපරිම වසර 10 | 30 |
| 02. | අධි ශ්‍රේණියේ සේවා කාලය<br>(අධි ශ්‍රේණියට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වසර 05 | 10 |
| 03. | පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ සේවා කාලය<br>(පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වසර 10 | 20 |
| 04. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | 04.1 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය<br><br>04.1.1 ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත රාජ්‍ය හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් පිරිනමන විෂයානුබද්ධ මහජන සෞඛ්‍ය උපාධියක් නම් ( පහත විෂයන් එම උපාධියට විෂයක් ලෙස හදාරා ඇත්නම් විෂයානුබද්ධ උපාධි ලෙස සැලකේ)<br>Control Of Communicable Diseases<br>Control Of Non-Communicable Diseases<br>Housing Sanitation<br>Epidemiology<br>Water Supply<br>Waste Disposal (Solid waste management)<br>Vector Control<br>Rabies Control<br>Food Safety<br>Sanitation in Institutions<br>School Health Work<br>Occupational Health and Estate Health<br>Sanitation during Disasters and Epidemics<br>Adolescent Health<br>Reproductive Health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team Work (Human Resource Management)<br>Counseling<br>Local Governance<br>Public Health Management<br>Human Resources Management<br>Legislation<br>Disaster Management<br><br>04.1.2 ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත රාජ්‍ය හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් පිරිනමන විෂයානුබද්ධ නොවන උපාධියක් නම් | එක් උපාධියක් නම් ලකුණු 05<br>උපාධි 02ක් නම් 2×5=10<br>(උපරිම උපාධි 02ක් සඳහා පමණි)<br><br>එක් උපාධියක් නම් ලකුණු 03<br>උපාධි 2ක් නම් 2×3=6<br>(උපරිම උපාධි 02ක් සඳහා පමණි) | 10 |

| | | | |
|---|---|---|---|
| 05. | 05.1 රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක ඩිප්ලෝමා<br><br>අදාල ඩිප්ලෝමාව<br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5/ NVQ6 මට්ටම හෝ<br>- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (Sri Lanka Qualifications Framework) හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය.<br><br>05.1.1 විෂයානුබද්ධ ඩිප්ලෝමාවක් නම්,<br>(පහත විෂයන් හෝ එම දක්වා ඇති විෂයන්ට අදාල ඩිප්ලෝමාවක් හදාරා ඇත්නම් විෂයානුබද්ධ ඩිප්ලෝමාවක් ලෙස සැලකේ)<br><br>Control Of Communicable Diseases<br>Control Of Non-Communicable Diseases<br>Housing Sanitation<br>Epidemiology<br>Water Supply<br>Waste Disposal (Solid waste management<br>Vector Control<br>Rabies Control<br>Food Safety<br>Sanitation in Institutions<br>School Health Work<br>Occupational Health and Estate Health<br>Sanitation during Disasters and Epidemics<br>Adolescent Health<br>Reproductive Health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team Work (Human Resource Management)<br>Counseling<br>Local Governance<br>Public Health Management<br>Human Resources Management<br>Legislation<br>Disaster Management<br><br>1. සෞඛ්‍ය අමාත්‍යාංශය/ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය/ රජයේ අධ්‍යයන ආයතනයකින් පවත්වන සේවස්ථ හෝ සේවස්ථ නොවන වැඩසටහනක් මගින් ලබාදෙන ඩිප්ලෝමාවක්<br><br>05.1.2 විෂයානුබද්ධ නොවන ඩිප්ලෝමාවක් නම්,<br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5/ NVQ6 මට්ටම හෝ<br>- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (Sri Lanka Qualifications Framework) හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය. | එක් ඩිප්ලෝමාවක් නම් ලකුණු 02<br><br>ඩිප්ලෝමා 3ක් නම් 2×3 (උපරිම ඩිප්ලෝමා 3ක් සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ)<br><br>එක් ඩිප්ලෝමාවක් නම් ලකුණු 1<br>ඩිප්ලෝමා 3ක් නම් 1×3 | 06 |
| 06. | 06.1 සහතික පත්‍ර පාඨමාලා - රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලද සහතිකයක් විය යුතුය.<br><br>06.1.1 විෂයානුබද්ධ නම්<br>(පහත විෂයන් හෝ එම දක්වා ඇති විෂයන්ට අදාල සහතික පත්‍රයක් ලබා ඇත්නම් විෂයානුබද්ධ සහතිකයක් ලෙස සැලකේ)<br><br>Control Of Communicable Diseases<br>Control Of Non-Communicable Diseases | එක් සහතික පත්‍ර පාඨමාලාවක් නම් ලකුණු 1<br><br>සහතික පත්‍ර පාඨමාලා 3ක් නම් 1×3 | 03 |

| | | | |
|---|---|---|---|
| | Housing Sanitation<br>Epidemiology<br>Water Supply<br>Waste Disposal (Solid waste management<br>Vector Control<br>Rabies Control<br>Food Safety<br>Sanitation in Institutions<br>School Health Work<br>Occupational Health and Estate Health<br>Sanitation during Disasters and Epidemics<br>Adolescent Health<br>Reproductive Health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team Work (Human Resource Management)<br>Counseling<br>Local Governance<br>Public Health Management<br>Human Resources Management<br>Legislation<br>Disaster Management<br><br>1. තම ආයතනය මගින් යොමු කර හෝ තමා විසින් පෞද්ගලිකව අයදුම්කර සෞඛ්‍ය අමාත්‍යාංශය/ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය/ රජයේ අධ්‍යයන ආයතනයකින් පවත්වන සේවස්ථ හෝ සේවස්ථ නොවන වැඩසටහනක් මගින් ලබාදෙන සහතිකයක් | (උපරිම සහතික පත්‍ර පාඨමාලා 3ක් සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ) | |
| 07. | 07.1 ඉංග්‍රීසි භාෂාව හා පරිගනක දැනුම<br><br>07.1.1 ඉහත 5.1.2 හි සඳහන් ඩිප්ලෝමාව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් නම් අදාළ ඩිප්ලෝමාව<br><br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5/ NVQ6 මට්ටම හෝ<br>- Sri Lanka Qualifications Framework හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය<br><br>07.1.2 ඉහත 5.1.2 හි සඳහන් ඩිප්ලෝමාව පරිඝණක දැනුම පිළිබඳ ඩිප්ලෝමාවක් නම් අදාළ ඩිප්ලෝමාව<br><br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5/ NVQ6 මට්ටම හෝ<br>- Sri Lanka Qualifications Framework හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය<br><br>07.1.3 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා<br><br>රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍රයක් විය යුතුය.<br>07.1.4 පරිගනක දැනුම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව Electronic Reproductive Health Information Management System පාඨමාලාව පමණක් විය යුතුය. | ලකුණු 02 (අමතර)<br><br>ලකුණු 02<br><br>ලකුණු 01<br><br>ලකුණු 01 | 04 |

| | | | |
|---|---|---|---|
| 08. | 08.1 දින 3කට වඩා වැඩි පුහුණුවීම<br><br>08.1.1 විෂයානුබද්ධ නම් පමණක්<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය/ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය/ විශේෂිත ව්‍යාපාර/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය/ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වැනි ආයතනයකින් උක්ත ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් වෙනත් ආයතනයක් මඟින් දින 03කට වඩා පවත්වන ලද පුහුණු/සේවාස්ථ වැඩසටහනක් සඳහා නිකුත් කරන සහතික පත්‍රයක් හෝ සහභාගීත්වය තහවුරු කරන ලිපියක් | ලකුණු 1 බැගින් 7 | 07 |
| 09. | 9.1 ප්‍රශ්න 5 (සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පරීක්ෂණ මණ්ඩලය මගින් අසනු ලබන විෂයානුබද්ධ වාචික ප්‍රශ්න) | ලකුණු 1 බැගින් ප්‍රශ්න 5 | 05 |
| | 9.2 සේවා ඇගයීම් (ජාතික මට්ටමේ හා පළාත් මට්ටමේ නම් පමණක්) | | 03 |
| | 9.3 සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 1×2<br><br>ව්‍යාපෘති ලෙස සලකා බලනු ලබන්නේ<br><br>1. බෝවන රෝග/ වසංගතවේදය<br>2. බෝ නොවන රෝගවලට<br>3. පරිසර සෞඛ්‍ය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, වාහක මර්දනය, අපජල කළමනාකරණය<br>4. ආහාර සෞඛ්‍යය<br>5. පාසැල් සෞඛ්‍යය<br>6. සෞඛ්‍ය ප්‍රවර්ධනය/ සෞඛ්‍ය අධ්‍යාපනය/ උපදේශනය<br>7. වෘත්තීය සෞඛ්‍යය<br>8. මහජන සෞඛ්‍ය නීතිය<br>9. ආපදා කළමනාකරණය යන විෂය ධාරාවන්ට අදාළව සිදු කරන ව්‍යාපෘතියක්<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය/ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය/ විශේෂිත ව්‍යාපාර/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය/ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වැනි ආයතනයකින් හෝ උක්ත ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් වෙනත් ආයතනයක් මඟින් පවත්වන පුහුණු/ සේවාස්ථ වැඩසටහනක් සඳහා සකස් කරනු ලබන ව්‍යාපෘතියක් (අදාළ ව්‍යාපෘතිය නිලධාරී විසින් සිදුකල බවට තහවුරු කර තිබිය යුතුය) | ව්‍යාපෘති 1ක් සඳහා ලකුණු 01<br>ව්‍යාපෘති 2ක් සඳහා ලකුණු 02 | 02 |

සැලකිය යුතුයි :

i. ඉහත සියලු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන සියළු සහතිකපත්‍ර රජයේ හෝ රජය පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් නිකුත් කළ ඒවා විය යුතුය.

ii. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවයට ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.

05. මහජන සෞඛ්‍ය පරීක්ෂක නව බඳවා ගැනීම් පරිපාටියේ 10.4 විශේෂ ශ්‍රේණියට උසස් කිරීම යටතේ 10.4.5.7 හි (අ) වගන්තිය ප්‍රකාරව අධි ශ්‍රේණියේ/ I ශ්‍රේණියේ අදාළ තනතුරු දරන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස්දෙනෙකු(05) යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එසේ සම්මුඛ පරීක්ෂණය සඳහා අදාළ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව කැඳවනු ලබන බැවින් යම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොවන්නේ නම් ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මඟින් මෙම කොමිෂන් සභා කාර්යාලයට ලිඛිතව දැනුම් දිය යුතුය.

**06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අන්දම:-**

I. මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත්වල සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් ලේඛන සමඟ සසඳා බලා නිරවද්‍යතාව පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව සහතික කළ යුතුය.

II. මේ සමඟ අයදුම්පත් ඉදිරිපත් කරන ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව සුදුසුකම් සපුරන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු මා වෙත යොමු කළ යුතු වේ. තවද ඔබ විසින් මා වෙත මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු එවීමට ප්‍රථමයෙන් **<u>එම පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර</u>**, කාර්ය සාධන වාර්තා, චර්යා සටහන්, වැටුප් වර්ධක ගෙවීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵලවල හෝ වෙනත් ලිපිලේඛනවල අඩුපාඩු ඇත්නම් ඒවා සම්පූර්ණ කර යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

III. බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව ලකුණු ගණනය කිරීමේ දී අසම්පූර්ණව පෞද්ගලික ලිපිගොනු ඉදිරිපත් කිරීම ගැටළුසහගත වන අතර එවැනි අවස්ථාවක දී **<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ</u>**. එබැවින් අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන ආයතන ප්‍රධානීන් විසින් අනිවාර්යයෙන්ම එම වගකීම දැරිය යුතු වේ. තම පෞද්ගලික ලිපිගොනුවේ ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ද දැනුවත් කිරීම සුදුසු වේ.

IV. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතන ප්‍රධානීන් විසින් පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතුය. පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් ලැබෙන අයදුම්පත් සියල්ලම එකම ආවරණ ලිපියක් මගින් මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත **2026.09.07** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. (එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ. තැපෑලේ දී සිදුවන අස්ථානගතවීම් පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.)

07. උසස්වීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයට අතිරේක වියදමක් නොවන පරිදි කෙටි දැනුම්දීමකින් උසස්වීම භාරගත යුතු වන අතර උසස්වීම ලැබෙන කවර හෝ ස්ථානයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. එසේ කටයුතු කළ නොහැකි උසස්වීම්ලාභියෙකු වේ නම් උසස්වීම අවලංගු කිරීමට සිදුවන බව දැනගත යුතුය.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව අයදුම්කරුවන් වෙත ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මඟින් හෝ අයදුම්කරුවන් සේවය කරන ආයතනයට හෝ යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

09. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත :-

ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත - කාරුණික දැනගැනීම සඳහා

## ආදර්ශ අයදුම්පත්‍රය

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විශේෂ ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

1. මුල'කුරු සමග නම:-...........................................................................................
2. සම්පූර්ණ නම :- ..........................................................................................
   ..........................................................................................
3. තනතුර:-..........................................................................................
4. දැනට සේවය කරන හෝ අවසන් වරට සේවය කළ ආයතනය:-..........................................
   ..........................................................................................
5. I. කාර්යාලීය ලිපිනය:-..........................................................................................
   II. පෞද්ගලික ලිපිනය:-..........................................................................................
   III. දුරකථන අංකය(පෞද්ගලික):-.............................. WhatsApp අංකය:-........................
   E-mail:-..........................................................................................
6. උපන් දිනය:-..........................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය:-..........................................................................................
8. විවාහක/අවිවාහක බව:-..........................................................................................
9. I. මුල් පත්වීම ලැබූ තනතුර හා දිනය:-..........................................................................................
   පත්වීම ස්ථිර කර තිබේද:- ඔව් / නැත පත්වීම ස්ථිර කළ දිනය :-.................................
   II. II 'අ' ශ්‍රේණියට උසස් කළ දිනය:-..........................................................................................
   III. II 'අ' කාර්යක්ෂමතා කඩඉම සමත් දිනය:-..........................................................................................
   IV. I ශ්‍රේණියට උසස් වූ දිනය(එම පත්වීම් ලිපියේ පිටපතක් අමුණන්න):-..............................
   V. I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය සපුරන දිනය:-..........................................................................................
   I ශ්‍රේණියට උසස් වූ දින සිට 2025.10.24 දිනට සේවා කාලය:- අවු:....... මාස:....... දින: .......
   VI. එම ශ්‍රේණියේ සේවා කඩවීමක් සිදුවී ඇත්ද:- ඔව් / නැත
   සේවා කඩවීම් සිදුව ඇති කාලසීමාව:-..........................................................................................
   නැවත සේවයේ පිහිටුවනු ලැබූ දිනය:-..........................................................................................
   VII. අධි ශ්‍රේණියට උසස් වී ඇත්නම් උසස් වූ දිනය:-..........................................................................................
   අධි ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය සපුරන දිනය:-..........................................................................................
   අධි ශ්‍රේණියට උසස් වූ දින සිට 2025.10.24 දිනට සේවා කාලය:- අවු:...... මාස:...... දින:.....
   VIII. විශ්‍රාම ගිය දිනය/ විශ්‍රාම යාමට නියමිත දිනය ….…………………………………..

අකාර්යක්ෂමතාවය හේතුවෙන් මා විශ්‍රාම ගැන්වීමට කටයුතු අරඹා නොමැති බවත් මට විරුද්ධව පවත්වා හෝ පැවැත්වෙතැයි අදහස් කරන විනයානුකූල ක්‍රියාමාර්ගයක් නොමැති බවත් ප්‍රකාශ කරමි. ඉහතින් මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව හෙළිවුවහොත් එසේ සාවද්‍ය බව හෙළිවූයේ තෝරා ගැනීමට පෙර නම් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනිමෙන් පසුව හෙළිවුවහොත් මා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය:-.......................................                    ..........................................

අයදුම්කරුගේ අත්සන

10. නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන ඇති බව:-

| වර්ෂය | වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත | වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම් ඊට හේතුව කෙටියෙන් |
|---|---|---|
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |
| 2024 | | |
| 2025 | | |

11. සුදුසුකම් සපුරාලන දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ ලබා ඇති කාර්යසාධන මට්ටම

| වර්ෂය | කාර්යසාධන මට්ටම | විශේෂ සටහන් |
|---|---|---|
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |
| 2024 | | |
| 2025 | | |

12. විශේෂ ශ්‍රේණියේ පත්වීම ලැබීමට සුදුසුකම් ලබා ඇති වර්ෂයට පෙර වසර 05 තුළ ලබා ඇති නිවාඩු විස්තර

| නිවාඩු වර්ගය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| අනියම් | | | | | |
| විවේක | | | | | |
| අඩ වැටුප් | | | | | |
| වැටුප් රහිත | | | | | |

13. විශේෂ ශ්‍රේණියේ පත්වීම ලැබීමට සුදුසුකම් ලබා ඇති වර්ෂයට පෙර වසර 05 තුළ විනය දඬුවම් ලබා හෝ ඉදිරියට ක්‍රියාත්මක කිරීමට හෝ තිබේද යන්න

| වර්ෂය | විනයානුකූල දඬුවමක් ලබා තිබේද ( ඔව් / නැත ) | විනයානුකූල දඬුවමක් ලබා තිබේ නම් හේතුව කෙටියෙන් |
|---|---|---|
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |
| 2024 | | |
| 2025 | | |

ඉහත 1 සිට 13 දක්වා වූ සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය අනුව නිවැරදි බවට සහතික කරමි.

පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය පරීක්ෂා කරන ලද නිලධාරියාගේ,

නම:-.......................................................................................................................

තනතුර:-...................................................................................................................

අත්සන:-.............................................. දිනය:-..................................

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත

ඉහත සඳහන්.............................(ජා.හැ.අ.) දරන ...................................................... මහතා/මහත්මිය විසින් අයදුම්පතෙහි අංක 01 සිට 09 දක්වා සඳහන් කර ඇති කරුණු සහ පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය පරීක්ෂා කරන ලද නිලධාරියා විසින් 10 සිට 13 දක්වා සඳහන් කර ඇති කරුණු යන ඉහත සඳහන් සියලු කරුණු අදාළ නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි තිබෙන ලේඛන අනුව නිවැරදි බව සහතික කරමි.

ඔහු/ ඇය විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට නියමිත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා ........................... දිනට සියලු සුදුසුකම් සපුරාලන බවත් නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන්:- ........................................................................................

..........................................................................................................

...........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය:-......................................... (පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතනයේ ප්‍රධානියා)

කරුණාකර නිල මුද්‍රාව තබන්න

ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, සබරගමුව පළාත.

ඉහත සඳහන්.............................(ජා.හැ.අ.) දරන ...................................................... මහතා/මහත්මිය විසින් අයදුම්පතෙහි සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව සුදුසුකම් සපුරන නිලධාරීන් අතරට ඇතුළත් බවත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන්:- ........................................................................................

..........................................................................................................

...........................................

දිනය:-........................................ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

සබරගමුව පළාත

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත.

ඉහත සඳහන්...............................(ජා.හැ.අ.) දරන ...................................................... මහතා/මහත්මිය විසින් අයදුම්පතෙහි සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව සුදුසුකම් සපුරන නිලධාරීන් අතරට ඇතුළත් බවත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන්:- ........................................................................................

..........................................................................................................

දිනය:-........................................ ...........................................

ලේකම්

ප්‍රධාන අමාත්‍යාංශය,

සබරගමුව පළාත

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)